පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

| | |
|---|---|
| විෂය - චිත්‍ර කලාව | සතිය - 10 |
| | ශ්‍රේණිය - 6 |

සැකසුම - තමාලි පරණගම, උපුලී චතුරානි

මාවනැල්ල අධ්‍යාපන කලාපය

**නිපුණතාවය :-** 4.0 නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම :-** 4.2 ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා සිදුරු තහඩු ක්‍රමය භාවිත කරයි.

ආදරණීය දරුවනේ,

**<u>ක්‍රීඩා උත්සවයක් සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කරමු.</u>**

ආරාධනා පත්‍ර අයත් වන්නේ ග්‍රැෆික් (Graphic) චිත්‍ර ගණයටය. එනම් මෙම මුද්‍රණ කටයුත්තක් තවත් පැහැදිලි කරනවා නම්, **එකකට වඩා වැඩි පිටපත් සංඛ්‍යාවක් අවශ්‍ය වන අවස්ථාවකදී ඒවා ලබා ගන්නා ක්‍රමය මුද්‍රණය ලෙස හඳුන්වයි.**

1. සීල් මුද්‍රණය
2. ටෙම්ප්ලේට් මුද්‍රණය (Templete)
3. ස්ටෙන්සිල් මුද්‍රණය (Stencil)


ස්ටෙන්සිල් මුද්‍රණ ක්‍රමය සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමය ලෙසද හඳුන්වයි.

**<u>ස්ටෙන්සිල් මුද්‍රණ ක්‍රමය යොදාගෙන ආරාධනා පත්‍ර නිර්මාණය කරමු.</u>**

**අවශ්‍ය ද්‍රව්‍ය :-** බ්‍රිසිල් බෝඩ් කොටසක්, පේපර් කටර් / බ්ලේඩ් එකක්, දියසායම්, බුරුසුවක් හා පනාවක්

**උපදෙස් හා කරන පියවර :-**

- චිත්‍ර පොතේ ආරාධනා පත්‍රයේ ඉදිරිපස හා පිටුපස සුදුසු ප්‍රමාණයකට සීමා රේඛා ඇඳ ගන්න.



**<u>නිර්මාණය කරන ආකාරය පියවර ලෙස,</u>**

1. තරමක ඝනකම කඩදාසියක් / කාඩ් බෝඩ් කැල්ලක් ගන්න.

2. එහි චිත්‍ර පොතේ ඇඳගත් ප්‍රමාණයට ( ඉදිරිපස කොටස) කොටුවක් ඇඳ කපා ගන්න.

3. මේ කපාගත් කොටුවේ ප්‍රමාණයටම A4 කඩදාසියක ක්‍රීඩා උත්සවයකට ගැලපෙන පරිදි රූප, හැඩතල, සංකේත ආදිය සැලසුම් කරන්න.

4. එසේ ඇඳගත් දළ සටහන බ්‍රිසිල් බෝඩ් එක මත තබා පිටපත් කරගන්න.

සිදුරු තහඩු මුද්‍රණය සඳහා රූප සටහන් අඳින විට හැඩතල වෙන් සේ කපා ගැනීමට හැකිවන පරිදි ආධාරක රේඛා සහිතව රූප සටහන් අඳින්න.

5. මේ ආකාරයට ක්‍රීඩා උත්සවයකට ගැලපෙන රූප සටහන් සංකේත ආධාරක රේඛා සහිතව අඳින්න.

6. බ්ලේඩ් එකක් හෝ කඩදාසි කපනයක් ආධාරයෙන් ආධාරක තීරු ඉතිරිවන සේ අනෙකුත් කොටස් කපා ඉවත් කරන්න.

7. දිය සායම් වලින් සකස් කර ගන්නා ලද සායම් මේ සඳහා සූදානම් කරගන්න.

8. අදාල සිදුරු තහඩුව ඔබ නිර්මාණය කරනු ලබන තලය මත තබන්න.

9. දත් බුරුසුවක සායම් තවරා පනාව උපයෝගී කරගෙන සිදුරු තහඩුව මත විසුරුවන්න.

10. සායම් හොඳින් වියලුණු පසුව ප්‍රවේශමෙන් සිදුරු තහඩුව ඉවත් කරන්න.

පහත ආදර්ශ හොඳින් නිරීක්ෂණය කර නිර්මාණය අලංකරණය කරගන්න.

